**MEDIA RELEASE – 02 MARCH 2011**

# කපිල ආරියරත්න සෙලාන් බැංකුවේ නව ප්‍රධාන විධායක නිලධාරිවරයා ලෙස පත්වේ

තම නව සාමාන්‍යාධිකාරි / ප්‍රධාන විධායක නිලධාරිවරයා ලෙස කෘතහස්ත බැංකුකරුවකු වන කපිල ආරියරත්න මහතා පත්වූ බව සෙලාන් බැන්ක් PLC නිවේදනය කරයි.

බැංකු ක්ෂේත්‍රයේ ප්‍රවීණයකු වන ආරියරත්න මහතා එම ක්ෂේත්‍රයේ පුළුල් පරාසයක විහිදුණු වසර 25ක පලපුරුද්දක් ඇති පුද්ගලයෙකි. වසර 1984දී ග්‍රින්ඩ්ලේස් බැන්ක් PLC හි පුහුණු කළමණාකරුවකු ලෙස බැංකු ක්ෂේත්‍රය වෙත පිවිසි ඒ මහතා අනතුරුව එළඹි වසර 27ක කාලය තුළ ඒ. බී. එන්. ඇම්රෝ බැන්ක් එන්. වී., මෂ්රෙක් බැන්ක් PSC, ඇරබ් නැෂනල් බැන්ක් (රියාද්), මහජන බැංකුව, නේෂනස් ට්‍රස්ට් බැන්ක් PLC, වැනි දේශිය සහ ජාත්‍යන්තර බැංකු කීපයකම නිලතල දරමින් ජාත්‍යන්තර, රාජ්‍ය සහ පුද්ගලික යන සමස්ත අංශවලම බැංකු කටයුතු පිළිබඳ මෙරටදී මෙන්ම විදේශයන්හීද හසළ දැනුමක් ලබා ගැනීමට සමත් විය.

ආයතනික බැංකුකරණය පිළිබඳ අනල්ප අත්දැකීම් සහිත ආරියරත්න මහතා ජාත්‍යන්තර වෙළඳ මූල්‍ය මෙහෙයුම්, පාරිභෝගික සේවා මෙහෙයුම්, ණය අවදානම් කළමනාකරණය මෙන්ම SME සහ ක්ෂුද්‍ර මූල්‍යකරණය (Microfinance), ආදී සියලු අංශ පිළිබඳ මනා පලපුරුද්දක් සහිත නිලධාරියෙකි. වසර 2001 දී රාජ්‍ය අංශයේ ප්‍රධාන පෙළේ බැංකුවක් ප්‍රතිව්‍යුහගතකරණය සඳහා කටයුතු කළ කණ්ඩායමේ සාමාජිකයකු වූ ආරියරත්න මහතා වත්මන් අභියෝගයන් ජය ගැනීම සඳහා සහ අවස්ථාවන් වලින් උපරිම ඵල ලැබීම සඳහා විශාල ආයතනවල මූලික වෙනස්කම් සිදුකිරීමේහිලා ක්‍රමවේදයක් සහිත පුද්ගලයෙකු ලෙසද ප්‍රසිද්ධය.

කොළඹ රාජකීය විදුහලේ ආදි ශිෂ්‍යයකු වන ඒ මහතා, කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රථම පංතියේ ගෞරව උපාධිධාරියෙකුද වේ. දක්ෂ ක්‍රීඩකයකු ද වන ඔහු රග්බි පාපන්දු ක්‍රීඩාව සඳහා රාජකීය විද්‍යාලයීය වර්ණ ලාභියෙකු මෙන්ම රග්බි පාපන්දු සහ හොකී ක්‍රීඩාව සඳහා විශ්ව විද්‍යාලයීය වර්ණ ලාභියෙකුද වේ. එසේම ඔහු රග්බි ක්‍රීඩකයකු ලෙස සී. ආර්. ඇන්ඩ් එෆ්. සී. ක්‍රීඩා සමාජය නියෝජනය කොට තිබේ.

මේ පිළිබඳව තම අදහස් දැක්වූ සෙලාන් බැංකුවේ සභාපති ඊස්ට්මන් නාරංගොඩ මහතා මෙසේ පැවසීය. "අප සමාගමේ සේවය සඳහා එක්වන ජ්‍යෙෂ්ඨ බැංකුකරුවකු වන කපිල ආරියරත්න මහතාව අප ඉතා සාදරයෙන් පිළිගනු ලබනවා. මේ වන විට බැංකුව ඉතා අපේක්ෂාසහගත සහ සුබවාදී වෙනසකට මෙන්ම වර්ධනයකටද පත්ව ඇති බව අප දන්නවා. මේවැනි වාතාවරනයක් තුළ ප්‍රධාන විධායක නිලධාරිවරයා ලෙස ආරියරත්න මහතාගේ හසල දැනුම ශ්‍රී ලංකාවේ මූල්‍ය ක්ෂේත්‍රය තුළ සෙලාන් බැංකුව තම සීඝ්‍ර වර්ධනය අඛන්ඩව පවත්වාගැනීම සඳහා විශාල දායකත්වයක් ලබා දෙනු ඇතැයි අධ්‍යක්ෂ මණ්ඩලය සහ මා තරයේ විශ්වාස කරනු ලබනවා."

**Caption for Photo** - සෙලාන් බැංකුවේ නව ප්‍රධාන විධායක නිලධාරිවරයා කපිල ආරියරත්න

**Media Contact**
Tilan Wijeyesekera as DGM (Marketing) Seylan Bank – 077 2268 600
Adahas PR Kumar 0777 379 973. Tharindra 0777 560 611